ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

2003 අංක 25 දරන මුදල් පනත

[සහතිකය සටහන් කලේ 2003 අගෝස්තු මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2003 අගෝස්තු මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදි

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 9.50 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

2003 අංක 25 දරන මුදල් පනත

[සහතිකය සටහන් කළේ 2003 අගෝස්තු මස 20 වන දින]

එල්. ඩී.–ඕ. 21/2003

ගුවන් යානා ටිකට්පත් නිකුත් කිරීම මත සහ නැව් ගමනක් සම්බන්ධයෙන් නිකුත් කරන ටිකට්පත් මත බද්දක් පැනවීම සඳහා ද 1961 අංක 19 දරන අපගමන බදු පනත ඉවත් කිරීමට සහ (365 වන අධිකාරය වූ) ගුවන් සංතරණ පනත සංශෝධනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සහ 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත යටතේ බලපත්‍රලත් ආයතනවල පිරිවැටුම් මත බද්දක් අය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඒ හා සම්බන්ධ හා ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2003 අංක 25 දරන මුදල් පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2003 සැප්තැම්බර් මස 1 වන දින එය ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය.

I වන කොටස

අපගමන බද්ද

2. (1) අපගමන බද්ද යනුවෙන් හැඳින්වෙන, එක්සත් ජනපද ඩොලර්වලින් ගණන් බැලිය යුතු, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයකින් විය යුතු වූ ද බද්දක්, මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට සහ ඉන් පසුව- අපගමන බද්ද.

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත්වන ගුවන් යානයකින්, ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන ගුවන් මගීන්ට ශ්‍රී ලංකාවෙන් පිටත දී නිකුත් කරන ලද සෑම ගුවන් යානා ටිකට්පතකින්ම හෝ පනවා අයකර ගත යුතු අතර, ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන තැනැත්තන්ට ශ්‍රී ලංකාවේ නිකුත් කරන ලද සෑම ගුවන් යානා ටිකට්පතකින්ම, භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ අනුමතය ඇතිව නිසි බලධරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි විනිමය අනුපාතිකයකට අනුව ශ්‍රී ලංකා මුදලින් ඊට සමාන මුදල් ප්‍රමාණයක් පනවා අය කරගත යුතු ය :

2—H 018543—4,500 (2003/06)

එසේ වුව ද, යම් ගුවන් යානයකින් ගමන් ගන්නා සංක්‍රාන්තික මගියකුට ශ්‍රී ලංකාවෙන් පිටත දී නිකුත් කරන ලද ගුවන් ටිකට්පතක් වෙනුවෙන් කිසිම අපගමන බද්දක් පැනවීම සහ අයකර ගැනීම නොකළ යුතු ය : සහ

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන නැවකින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන මගියකු සඳහා නිකුත් කරන සෑම ටිකට්පතකින්ම පනවා අයකර ගත යුතු ය.

මේ උපවගන්තියේ කාර්ය සඳහා "සංක්‍රාන්තික මගියා" යන්නෙන්, ශ්‍රී ලංකාවට ගොඩබැසීමෙන් පසු පැය විසිහතරක් ඇතුළත වෙනත් ඊට සම්බන්ධිත ගුවන් යානා ගමන් වාරයක් මගින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන ගුවන් මගියකු අදහස් වේ.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන–

(අ) වයස අවුරුදු දෙකකට අඩු ළමයින් ;

(ආ) එම ගුවන් යානයේ හෝ නැවේ නිලධරයන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයන් ;

(ඇ) නියම කරනු ලැබිය හැකි වෙනත් යම් තැනැත්තන්,

කෙරෙහි අදාළ නොවිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් කරන ලද නියමයක්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන පසුව කරනු ලබන නියමයක් මගින් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ සුලු වශයෙන් වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය.

මෙහෙයවන්නා විසින් අපගමන බද්ද එකතු කරගත යුතු බව.

3. සෑම ගුවන් යානයක් හෝ නැවක් මෙහෙයවන්නා විසින් අපගමන බද්ද එකතු කරගත යුතු අතර, නිසි බලධරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයකට ශ්‍රී ලංකා ආණ්ඩුව වෙත ගෙවනු ලැබිය යුතු ය.

මෙහෙයවන්නා විසින් නිසි බලධරයාට අපගමන බද්ද ගෙවිය යුතු බව.

4. (1) ගුවන් යානා හෝ නැව් මෙහෙයවන්නා විසින් ඔහු මෙහෙයවන ගුවන් යානාවෙන් හෝ නැවකින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන මගියකුගෙන් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගේ අනුමතය ඇතිව නිසි බලධරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට නිසි බලධරයාට ගෙවනු ලැබිය යුතු ය. නිසි බලධරයා සහ මෙහෙයුම්කරු අතර එම ගෙවීම සම්බන්ධයෙන් ඇතිවිය හැකි යම් ආරවුලක් අදාළ නීතියට අනුකූලව සමථයකට පත් කළ යුතු ය.

(2) අපගමන බද්ද ගෙවීමට යටත් මගින් සංඛ්‍යාව සම්බන්ධයෙන්, නිසි බලධරයා සහ මෙහෙයවන්නා අතර හබයක් ඇති වූ අවස්ථාවක දී නිසි බලධරයා ඉදිරිපත් කරන සංඛ්‍යාවලට අනුකූලව, මෙහෙයවන්නා විසින් ඔහු කියා සිටින හිමිකම් පෑම තහවුරු කිරීම පිණිස ඔහුගේ සන්තකයේ තිබෙන වෙනත් යම් ලේඛනගත සාක්ෂි නිසි බලධරයා වෙත ඉදිරිපත් කිරීමේ අයිතිවාසිකමට යටත්ව, අපගමන බද්දක් ගෙවිය යුතු ය.

(3) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට අනුකූලව, අදාළ ගුවන් යානයේ මෙහෙයවන්නා විසින් යම් අර්ධ මාසික කාලයක් සඳහා ගෙවිය යුතු යම් අපගමන බද්දක් නිසි බලධරයාට ගෙවනු නොලැබූ අවස්ථාවක, එම මුදල ගෙවීම පැහැර හැර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, යම් මාසයක දී මූලික ණය අනුපාතය අනුව අනුප්‍රමාණ කරන ලද සාමාන්‍යය මත ගණන් බලනු ලැබූ පොලියක් සහ සියයට දෙකක් එම මුදලට එකතු කර, අය කර ගනු ලැබිය යුතු ය. කෙසේ වුව ද ගෙවීම පැහැර හැර ඇති එක් එක් මාසය සඳහා, ගෙවීම පැහැර හැර ඇති සම්පූර්ණ මුදල මත ඉහත කී අනුප්‍රමාණයට අනුව පොලිය පනවා අයකර ගත යුතු ය.

5. (1) මේ කොටස යටතේ එකතු කරනු ලබන මුදල් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වි සින් කලින් කල නිකුත් කරනු ලැබිය හැකි උපදෙස්වලට අනුකූලව නිසි බලධරයා විසින් බෙදා හරිනු ලැබිය යුතු ය. මුදල් බෙදා හැරීම, නිසි බලධරයා විසින් කරනු ලබන බව.

(2) නිසි බලධරයා විසින්, එකතු කරගත් මුදල් සහ වෙනත් අදාළ විස්තර ද පිළිබඳ මාසික වාර්තාවක් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයා විසින්, අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවල දී ඒ වාර්තාවලින් පැනනගින යම් කරුණක් සම්බන්ධයෙන් යම් තොරතුරු හෝ පැහැදිළි කිරීම් ලබා දෙන ලෙස ඉල්ලුම් කළ හැකි ය.

6. මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි පරිදි නිසි බලධරයා විසින් ඉල්ලා සිටිනු ලැබූ විට, යම් ගුවන් යානයක හෝ නැවක මෙහෙයවන්නා විසින් ඒ ගුවන් යානයෙන් හෝ නැවෙන් ශ්‍රී ලංකාවේ සිට ප්‍රවාහණය කරන මගීන් සම්බන්ධයෙන් මෙහෙයවන්නා දන්නා යම් තොරතුරු, නිසි බලධරයා වෙත සැපයිය යුතු ය. මෙහෙයවන්නා විසින් නියමිත තොරතුරු සැපයිය යුතු බව.

වාර්තා.

7. (1) අවස්ථාවෝචිත පරිදි මෙහෙයවන්නකුගේ පාලනය යටතේ ඇති ගුවන් යානයකින් හෝ නැවක් මගින් ගමන් ගන්නා මගීන් සම්බන්ධයෙන් සහ මෙහෙයවන්නා විසින් එකතු කර ගනු ලබන අපගමන බදු පිළිබඳව, මෙහෙයවන්නා විසින් නිසි වාර්තා පවත්වාගත යුතු ය.

(2) අපගමන බදු ගෙවීම සහ එකතු කිරීම සම්බන්ධ වාර්තා, මෙහෙයවන්නා වෙත කරනු ලබන වෙනත් ගෙවීම් පිළිබඳ වාර්තාවලින් වෙන්ව පවත්වාගත යුතු ය.

(3) අවුරුදු දෙකක කාල සීමාවකට පසුව, මෙහෙයවන්නා විසින් නිසි බලධරයාගේ එකඟත්වය ඇතිව, (1) වන උපවගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලැබීමට නියම කරනු ලබන වාර්තා විනාශ කරනු ලැබිය හැකි ය.

වාරවාර්තා.

8. (1) මෙහෙයවන්නාගේ පාලනය යටතේ ඇති යම් ගුවන් යානයක හෝ නැවක මගීන් පිළිබඳ විස්තර ද එම ගුවන් යානයේ හෝ නැවේ පිටත්වීම් පිළිබඳව ද අපගමන බද්ද හෝ අපගමන බද්ද අය කර ගැනීමට අදාළව නිසි බලධරයාට අවශ්‍ය විය හැකි තොරතුරු ද ලබා දෙමින් නිසි බලධරයා විසින් නිශ්චිතව නියම කරනු ලබන ආකෘතියෙහි වූ වාර වාර්තා එම මෙහෙයවන්නා විසින් නිසි බලධරයා වෙත සැපයිය යුතු ය. එවැනි සෑම වාර වාර්තාවක්ම පිටපත් තුනකින් යුක්තව ඉදිරිපත් කළ යුතු අතර, එහි එක් පිටපතක් මෙහෙයවන්නා විසින් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැක්වෙන කිසිවකින්, තත්කාලයේ බලපවත්නා වෙනත් යම් නීතියක් යටතේ, ඒ නීතියේ නම් කර තිබෙන ගුවන්යානා ක්‍රියාකාරිත්වයක් හෝ නැවකට අදාළ ක්‍රියාකාරිත්වයක් පිළිබඳ තොරතුරු සැපයීමට පවත්නා බැඳීමකට බලපෑමක් ඇතිකරවීමක් හෝ ඒ බැඳීමක බලය හීන කරවීමක් සිදු නොවිය යුතු ය.

(3) නිසි බලධරයා විසින් නියම කරනු ලැබූ විට නිසි වාර්තා සැපයීමට මෙහෙයවන්නා අපොහොසත් වන අවස්ථාවක දී, නිසි බලධරයා විසින් ඒ මෙහෙයවන්නා වෙත ගුවන්යානයේ හෝ නැවේ මගී ලේඛනයේ සිටින මුළු මගීන් ප්‍රමාණය මත ගණනය කරන ලද මුදලක් අපගමන බද්දක් ලෙස ගෙවන ලෙසට නියම කරනු ලැබිය හැකි ය.

(4) සපයන ලද තොරතුරුවල එක් ගමන් වාරයක් මුළුමනින්ම අතහැර ඇති අවස්ථාවක, ඒ ගමන් වාරයේ සම්පූර්ණ ආසන සංඛ්‍යාව අනුව අපගමන බද්ද ආගණනය කර, එම සම්පූර්ණ ආසන සංඛ්‍යාව අනුව මෙහෙයවන්නාගෙන් බද්ද අයකර ගත යුතු ය.

තොරතුරුවල නිවැරදිභාවය නිසි බලධරයා විසින් සත්‍යායනය කරගත යුතු බව.

9. (1) ගුවන් යානයක හෝ නැවක මෙහෙයවන්නකු විසින් මේ පනත ප්‍රකාරව සපයන ලද යම් තොරතුරක නිවැරදිතාවය සත්‍යායනය කර ගැනීමේ කාර්යය සඳහා හෝ මේ පනත හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයකට අනුකූලව ක්‍රියාකිරීම සහතික කර ගැනීමේ කාර්යය සඳහා නිසි බලධරයා විසින් -

(අ) ගුවන්යානා මගින් හෝ නැව් මගින්, මගීන් ගෙනයන්නකු වශයෙන්, මෙහෙයවන්නා කරගෙන යන ව්‍යාපාරය සඳහා මෙහෙයවන්නා විසින් ශ්‍රී ලංකාවේ ප්‍රයෝජනයට ගන්නා යම් පරිශ්‍රයකට ඇතුළුවීම ; සහ

(ආ) (i) ඒ මෙහෙයවන්නාගේ යම් ගුවන් යානයකින් හෝ නැවකින් ශ්‍රී ලංකාවෙන් ප්‍රවාහනය කරන මගීන් පිළිබඳ ; සහ

(ii) ඒ මෙහෙයවන්නා විසින්, ඔහුගේ ව්‍යාපාරයට අදාළව (මේ පනත ප්‍රකාර හෝ අන්‍යාකාරව වුවද) ඔහු එකතු කළ අපගමන බද්ද පිළිබඳ,

පවත්වාගෙන යන යම් වාර්තාවක් පරීක්ෂා කිරීම සහ එහි පිටපත් ගැනීම කරනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගවල විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරන බව සහතික කරගැනීමේ කාර්යය සඳහා, නිසි බලධරයා විසින් හෝ ඔහු විසින් ලියවිල්ලක් මගින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවට පැමිණෙන හෝ ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන යම් ගුවන් යානයකට හෝ නැවකට ඇතුළු වී අවස්ථාවෝචිත පරිදි ඒ ගුවන් යානය හෝ නැවේ ප්‍රවාහනය කරනු ලබන මගීන් සම්බන්ධයෙන් වූ තොරතුරු ඇතුළත් යම් ලේඛනයක් නිසි බලධරයා හෝ ඔහු විසින් ලියවිල්ලක් මගින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින් පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස එම ගුවන් යානයේ නියමුවාට හෝ නැවේ නෞකාධිපතිවරයාට නිසි බලධරයා හෝ ඔහු විසින් ලියවිල්ලක් මගින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින් නියම කරනු ලැබිය හැකි ය.

අර්ථ නිරූපණය.

10. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ මේ කොටසෙහි -

ශ්‍රී ලංකාවෙන් පිටවී යන තැනැත්තන්ගෙන්, අපගමන බද්ද අයකිරීමට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් එන විට "නිසි බලධරයා" යන්නෙන්,

(අ) එම තැනැත්තන් ගුවන් යානයකින් ගමන් කරන විට, 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 11 වන වගන්තිය යටතේ පත් කරන ලද සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ ;

(ආ) එම තැනැත්තන් නැවකින් ගමන් කරන විට 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනත යටතේ පත් කරන ලද වෙළෙඳ නැව් අධ්‍යක්ෂවරයා, අදහස් වේ.

" කපිතාන්" යන්න, ගුවන් යානයකට හෝ නැවකට අදාළව යෙදෙන විට, ඒ ගුවන් යානයේ හෝ නැවේ තත්කාලීන භාරය, අණදීම හෝ පාලනය දරන තැනැත්තා අදහස් වේ ;

"මෙහෙයවන්නා" යන්න,

(අ) ගුවන් යානයක් සම්බන්ධයෙන් යෙදෙන විට එයින් ගුවන් යානයක අයිතිකරු හෝ අයිතිකරු වෙනුවට ක්‍රියා කරන තැනැත්තකු හෝ ඒ ගුවන් යානයේ නියමුවා හෝ අදහස් වේ ; සහ

(ආ) නැවක් සම්බන්ධයෙන් යෙදෙන විට එයින් නැවේ අයිතිකරු, සහ 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට බලපත්‍රදීමේ පනත යටතේ බලපත්‍රයක් සතුව සිටින නැවේ අයිතිකරු වෙනුවට ක්‍රියා කරන තැනැත්තා හෝ ඒ නැවේ නෞකාධිපතිවරයා අදහස් වේ.

"මගී ලේඛනය" යන්නෙන්, මෙහෙයවන්නා විසින් සහතික කරන ලද හා එක් ගමනාන්තයක සිට අනෙක් ගමනාන්තය දක්වා ගමන් කිරීමේ දී ගුවන් යානයෙහි හෝ නැවෙහි ගෙන යනු ලබන මගී ලැයිස්තුව අදහස් වේ.

II වන කොටස

සංචාරක සංවර්ධන බද්ද

11. මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසුව 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත යටතේ බලපත්‍ර දෙන ලද සෑම ආයතනයකින්ම සෑම වර්ෂයක් තුළ දී ම එම ආයතනයේ පිරිවැටුමෙන් සියයට එකක බද්දක් අයකරගනු ලැබිය යුතු අතර, එම බද්ද සංචාරක සංවර්ධන බද්ද යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ය.

සංචාරක සංවර්ධන පනත යටතේ ලියාපදිංචි කරන ආයතන මත බද්ද පැනවීම.

12. (1) 11 වන වගන්තිය යටතේ පනවනු ලැබූ බද්ද මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා අදාළ අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයට ගෙවනු ලැබිය යුතු අතර, එම මුදල 1966 අංක 10 දරන ශ්‍රී ලංකා සංචාරක මණ්ඩල පනත මගින් පිහිටුවනු ලැබූ ලංකා සංචාරක මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකතු කර ගනු ලැබිය යුතු ය.

සංචාරක සංවර්ධන බද්ද ගෙවීමේ ක්‍රමය.

(2) (1) වන උපවගන්තිය යටතේ එකතු කර ගනු ලැබූ බද්ද, සම්පූර්ණයෙන්ම, ලංකා සංචාරක මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඔහු වෙත රඳවා තබාගත යුතු ය. එම මුදල් ප්‍රමාණය එකතු කර ගනු ලැබූ දින සිට දින තිහක් ඇතුළත නියමිත පරිදි වූ වාර වාර්තා ද තත් කාර්යය සඳහා නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකින්, ඔහු විසින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත සපයනු ලැබිය යුතු ය.

13. මේ කොටසේ කාර්ය සඳහා, 'පිරිවැටුම' යන්නෙන්-

පිරිවැටුමේ අර්ථ නිරූපණය.

(අ) සංචාරක හෝටලයක් සම්බන්ධයෙන් වන විට, සම්පූර්ණ විකුණුම්වලින් සියයට දහයක් දක්වා වූ සේවා ගාස්තුව සහ 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත ප්‍රකාරව එම විකුණුම් මත අයකරනු ලබන එකතු කළ අගය මත බද්ද හැර, එම මුළු විකුණුම්වලින් ලැබුණ හෝ ලැබිය යුතු මුදල් ප්‍රමාණය අදහස් වේ :

(ආ) සංචාරක අනුයෝජිතයකු සම්බන්ධයෙන් වන විට, වෙනත් දේශීය සේවා සපයන්නකු විසින් එම සංචාරක අනුයෝජිතයා වෙත සපයන ලද සේවා සම්බන්ධයෙන් ඔහු විසින් ගෙවන ලද මුදල් සහ 2002 අංක 14 දරන එකතුකළ අගය මත බදු පනත ප්‍රකාරව සංචාරක කර්මාන්තයට අදාළව සපයන ලද සේවා මත අයකරන ලද එකතු කළ අගය මත බද්ද හැර සපයනු ලබන සේවාවලින් ලැබූ සම්පූර්ණ මුදල අදහස් වේ ;

(ඇ) සංචාරක සාප්පුවක් සම්බන්ධයෙන් වන විට එවැනි යම් සාප්පුවක නිෂ්පාදන විකිණීමෙන් ලැබෙන මුළු මුදල මත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත ප්‍රකාරව අයකරන ලද එකතු කළ අගය මත බද්ද හැර, එම සම්පූර්ණ විකුණුම්වලින් ලැබුණ හෝ ලැබිය යුතු මුදල අදහස් වේ.

III වන කොටස

1961 අංක 19 දරන අපගමන බදු පනත ඉවත් කිරීම සහ ගුවන් සංතරණ පනත සංශෝධනය කිරීම

1961 අංක 19 දරන පනත ඉවත් කිරීම.

14. (මේ කොටසෙහි ප්‍රධාන "ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1961 අංක 19 දරන අපගමන බදු පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

අන්තර්කාලීන විධිවිධාන.

15. (1) 2003 සැප්තැම්බර් මස 1 වන දිනට පෙරාතුව මිල දී ගත් ගුවන්යානා ටිකට්පත්වල හෝ නැව් මගින් ගමන් කිරීමට අදාළ ටිකට්පත්වල සන්තකය දරන සියලු තැනැත්තන්, එම ටිකට්පත් වලින් ගමන් කිරීම 2003 සැප්තැම්බර් මස 1 වන දිනට පසුව සිදුවන අවස්ථාවල දී සහ එම ටිකට්පත් මත 2 වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති අපගමන බද්ද එකතුකර ගෙන නොමැති අවස්ථාවල දී, මේ පනත යටතේ අපගමන බද්ද වශයෙන් අයවිය යුතු මුදල අවස්ථාවෝචිත පරිදි පිටත්වන ගුවන් තොටුපළේ හෝ වරායේ සිටින නිසි බලධරයා විසින් ලියවිල්ලකින් බලය දෙන ලද නිලධරයකුට ගෙවීමට ඒ තැනැත්තාට නියම කරනු ලැබිය යුතු ය. අපගමන බද්ද යථා පරිදි ගෙවා ඇති බවට නිසි බලධරයා විසින් ලියවිල්ලකින් බලය දෙන ලද නිලධරයා විසින් ටිකට් පතෙහි සටහනක් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියට අනුකූලව අපගමන බද්ද ගෙවන ලෙස ඉල්ලා සිටිනු ලැබූ විට, එය ගෙවීම ප්‍රතික්ෂේප කරන යම් තැනැත්තකුට, අවස්ථාවෝචිත පරිදි ගුවන් යානයට හෝ නැවට ගොඩවීමට අවසර දෙනු නොලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියට අනුකූලව අපගමන බද්ද අයකර ගැනීම පැහැර හරින නිසි බලධරයා විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් නිලධරයකු, එම බද්ද අයකර ගනු නොලැබූ එක් එක් ටිකට් පත සම්බන්ධයෙන් රුපියල් පන්සියයක දඩයකට යටත් විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ අපගමන් බදු වශයෙන් එකතු කර ගනු ලබන මුදල්, නිසි බලධරයා විසින් ලිඛිතව බලය පවරන ලද නිලධරයා විසින් දිනපතාම නිසි බලධරයා වෙත ගෙවනු ලැබිය යුතු ය. නිසි බලධරයා විසින් එම මුදල් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය. එම බද්දට අදාළ තොරතුරු ඇතුළත් වාර්තාවක් ඒ නිලධරයා විසින් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයා වෙත සතිපතා යැවිය යුතු ය.

365 වන අධිකාරයේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

16. 365 වන අධිකාරය වූ ගුවන් සංතරණ පනතේ 23 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) ඒ වගන්තියේ (2අ) උපවගන්තිය ඉවත් කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි "((2අ) උපවගන්තිය යටතේ ඔහු විසින් එකතුකර ගන්නා ලද අපගමන බදු ඇතුළුව)" යන වචන අත්හැරීමෙන්.

IV වන කොටස

සාමාන්‍ය

නියෝග.

17. (1) මේ පනත යටතේ නියම කිරීමට නියමිත සියලු කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට බලය පවරා ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) ඉහත සඳහන් කරුණුවල ව්‍යාප්තියට හානියක් නොමැතිව අමාත්‍යවරයා විසින් නියෝග මගින්—

(අ) මෙහෙයවන්නා විසින් අපගමන බද්ද ගෙවීමේ සහ එකතු කිරීමේ ක්‍රමය සහ ආකාරය ;

(ආ) මෙහෙයවන්නකු විසින් නිසිබලධරයා වෙත තැබිය යුතු තැන්පත් මුදලක හෝ එක් අවුරුද්දක් නොඉක්මවන යම් කාලසීමාවක් සඳහා දිය යුතු බැංකු ඇපකරයක ප්‍රමාණය ;

(ඇ) මේ පනත යටතේ එකතු කරගනු ලැබූ බදු බෙදා හැරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය;

(ඈ) මේ පනතේ කාර්ය සඳහා වාර්තා සෑදීම සහ එම වාර්තාවල ආකෘතිය ;

(ඉ) 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත යටතේ බලපත්‍ර දෙන ලද ආයතන වලින් බද්ද ගෙවීමේ සහ එකතු කිරීමේ ක්‍රමය සහ ආකාරය.

පිළිබඳව විධිවිධාන සලසනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

18. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.